**ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 20 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ

විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.17 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1<br>2.2 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. වත්කම් කළමනාකරණ අඩුපාඩු<br>2. අනුකූල නොවීම් | 2.6<br>2.14 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම.<br>2. අභ්‍යන්තර විගණනය<br>3. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.4.2<br>2.15<br>2.6 (ඇ) |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතීම<br>2. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම. | 2.6 (ආ)<br>2.6 (ඇ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරීයා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම. | 2.7 |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 2. අග්‍රිම ගිණුමේ අඩුපාඩු<br>3. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.11<br>2.12 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම | 2.10 (අ)(ආ) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.17 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

**සැලැසුම් කිරිම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 15 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන

11 ක, දෙපාර්තමේන්තු 02 ක, විදේශ ව්‍යාපෘති 22 ක හා දේශීය ව්‍යාපෘති 12 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරකම්වලට අදාලව ඉටු කරන ලද කාර්යයන් අනුව කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් ළඟා කර ගත යුතු ඉලක්කයන් ඉටු වී තිබේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ආ) ආගන්තුක ආක්‍රමණකාරී ජීවීන් ඇතුළුවීම හා පැතිරීම පාලනය සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතියට අදාල භෞතික ප්‍රගතිය සඳහන් වුවද මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සඳහන් කර නොතිබුණි.

**2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.4 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ආධාර ව්‍යාපෘති**

----------------------------------------------

**2.4.1 දේශීය ව්‍යාපෘති**

-----------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 12 ක් සඳහා එකතුව රු.මිලියන 24,093.5 ප්‍රතිපාදන ද සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 21,510.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2.582.28 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 10.72 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.4.2 විදේශ ආධාර ව්‍යාපෘති**

-----------------------

**විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යායනය යටතේ ව්‍යාපෘති 22 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.මිලියන 24,573.03 ක් වී තිබුණු අතර ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 16,008.44 ක් උපයෝජනය කර තිබුණි. එම විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය**

------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය හා ලෝක ආහාර වැඩසටහන අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 අගෝස්තු මස 11 දින එළඹි ගිවිසුම අනුව ව්‍යාපෘති කාලය වර්ෂ 03 කි. එහෙත් එහි ක්‍රියාකාරකම් ඉටුකර නොතිබීම නිසා 2018 අගෝස්තු දක්වා කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද වර්ෂ 03 ක් අවසන් වී තිබුණද සැලකිය යුතු මට්ටමක භෞතික ප්‍රගතියක් ළඟාකර ගෙන නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලස්මේ ඇතුළත් රු.මිලියන 194 ක් වූ ක්‍රියාකාරකම් 62 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරය විසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා ලබාදුන් අග්‍රිමවලින් රු.44,724,708 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.463,747,520 කින් රු.312,776,228ක් ඉතිරිවී තිබුණි. මේ අනුව ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනය සියයට 67 කි.

**(ආ)** ඕසෝන් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.247,150 ක දේපල, පිරියත හා උපකරණ මිලදී ගෙන තිබූ අතර විගණනයට ඉදිරිපත්කළ අවසන් මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුමේ ස්ථාවර වත්කම් සංචලන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති ඇගයීම් වාර්තාවට අනුව ව්‍යාපෘතියේ කාලසීමාව 2016 ජූලි 01 දින සිට 2021 ජුනි 30 දින දක්වා වන අතර ව්‍යාපෘතියේ කටයුතු 2016 ජූලි 26 දින සිට බල පැවැත්වෙන පරිදි සිදුකළ යුතුව තිබුණද, ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණේ 2016 දෙසැම්බර් 01 දින සිටය.

(ii) 2016 මාර්තු 12 දිනැති ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2017 වර්ෂයේ සිට ඉදිරියට ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සපුරා ගැනීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවත්, 2017 වර්ෂයට අදාල ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තුව මගින් සලසාගෙන නොතිබූ අතර මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(iii) ව්‍යාපෘතිය ආරම්භයේදීම සම්පූර්ණ ව්‍යාපෘති කාලසීමාව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවද, එය පිළියෙළ කර තිබුණේ 2018 වර්ෂයේදීය.

(iv) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර තිබූ අතර එම ක්‍රියාකාරී සැලැස්මට අනුරූපීව ප්‍රගති වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොවූ හෙයින් ව්‍යාපෘතියේ 2017

වර්ෂයේ ක්‍රියාකාරකම් ඉටු කිරීම සම්බන්ධ තොරතුරු විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) 2016 වර්ෂයේ දී අවසන් වීමට නියමිතව තිබූ දිගුකල් පවත්නා කාබනික දූෂක (POPs) පිළිබඳ වූ ස්ටොක්හෝම් සම්මුතියේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NIP) හා ඒ සම්බන්ධව සැකසූ අනෙකුත් වාර්තා මුද්‍රණය කිරීමේ කටයුතු නිම කර නොතිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී මුද්‍රණයට අදාල පිරිවිතරයන් අනුව වාර්තා මුද්‍රණය කර ඇති බවට තහවුරු කිරීමකින් තොරව රු.1,266,100 ක ගෙවීම් කර තිබුණි.

(ඉ) 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා ඒවා අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතියේ යෝජිත ක්‍රියාකාරකම්වලින් ක්‍රියාකාරකම් 04 ක් සමාලෝචිත වර්ෂය තුළ අවසන් කර නොතිබුණි.

(ඊ) රසදිය පිළිබඳ වූ මිනමාටා සම්මුතිය අපරානුමැතිය කිරීම සඳහා පසුබිම ගොඩනැංවීමේ ව්‍යාපෘතිය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3.97 ක් වූ අතර සත්‍ය වියදම රු.මිලියන 1.79 ක් වී තිබුණි. ඒ අනුව ඌන උපයෝජනය සියයට 55 ක් විය. මෙම ව්‍යාපෘතියේ 2017 ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව පාසල්, තාක්ෂණික විද්‍යාල හා විශ්වවිද්‍යාල සඳහා විද්‍යාගාර මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම සඳහා සැළසුම් කර තිබුණද, එය ඉටුකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදම රු.මිලියන 62,060.31 ක් වූ අතර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හා හදිසියේ ඇති වූ ජල කාන්දුවීම් හේතුවෙන් මහජනතාව විවිධ දුෂ්කරතාවලට පත්විය. ඒ වෙනුවෙන් දේශීය අරමුදලින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 896.72 ක් එම ජනතාව වෙත ගෙවා තිබූ අතර ඉන් රු.මිලියන 744.54 ක මුදලක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි.

(ඌ) 2011 අප්‍රේල් 21 දිනැති අංක MOFP/ERP/2011/1 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ විදේශ සම්පත් සංසරණය අනුකූලනය කිරීමේ චක්‍රලේඛය ප්‍රකාරව ඍජු විදේශ මූල්‍යාධාර සපයන ප්‍රදායක ආයතන සමඟ ඍජුවම ගනුදෙනු කිරීමට කිසිදු රාජ්‍ය ආයතනයකට අධිකාරි බලයක් හිමි නොවේ. එසේම රාජ්‍ය සංවර්ධන ප්‍රමුඛතා යටතේ ජාතික අයවැය මගින් මූල්‍යායනය නොවන අයුරින් ප්‍රදායක විදේශාධාර සපයා නොගත යුතුය. එසේ වුවත්, පහත සඳහන් ව්‍යාපෘති ඍජු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන බව විගණනයට නිරීක්ෂණය විය.

| **ව්‍යාපෘතියේ නම** | **ප්‍රදායක ආයතනය** | **සමස්ථ ව්‍යාපෘති මුදල** | **අපේක්ෂිත කාලය** |
| --- | --- | --- | --- |
| Implementation of the National Bio safety framework in accordance with Cartagena Protocol | GEF/FAO | USD 5,324,291 | 2017- 2020 |
| Biodiversity Finance Initiative | GEF/UNDP | USD 530,000 | 2016 – 2018 |

| | | | |
|---|---|---|---|
| 6th National Report | GEF/UNDP | USD 4,112,402 | 2017 – 2018 |
| SWITCH – Asia Sustainable Consumption & Production National Policy Support component | EU | EURO 1,867,500 | 2015 - 2019 |

## 2.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේම විදේශ ව්‍යාපෘති ගණනාවක් හා අංශ රැසකින් සමන්විත වූ මෙම අමාත්‍යාංශය සඳහා ප්‍රසම්පාදන ශාඛාවක් හෝ අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ ඒ ව්‍යාපෘති සඳහා වන අවශ්‍යතා ඒ ඒ අංශ මගින්ද සමහර මිලදී ගැනීම් ගිණුම් අංශය මගින්ද, නඩත්තු හා වාහන අළුත්වැඩියා කටයුතු ප්‍රවාහන අංශය මගින්ද සිදුකර තිබුණි. ඇස්තමේන්තු ලබා ගැනීම, මිල ගණන් කැඳවීම, සැපයුම හෝ සේවාවන් ලබා ගැනීම් ඒ ඒ අංශවල සහභාගීත්වයෙන් සිදුකර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කර තිබූ අවස්ථා පැවති අතර සියළු භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් ගබඩාව මාර්ගයෙන් සිදුකර නොතිබූ අවස්ථා පැවති බව ද නිරීක්ෂණය විය.

## 2.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු අනාවරණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අළුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගත හැකි තත්ත්වයේ පැවැති වාහන 08 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර වර්ෂ 06 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

අමාත්‍යාංශයට අයත් රු.මිලියන 5.80 ක් සහ රු.මිලියන 19.90 ක් වටිනා වාහන 02 ක් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට හා එකී රාජ්‍ය අමාත්‍යවරයාට විධිමත් පැවරීමකින් තොරව ලබාදී තිබුණි.

### (ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන 07 කට අයත් වාහන 20 ක් විධිමත්ව පවරා නොගෙන භාවිතයට ගෙන තිබුණි.

**2.7 බැදීම් හා බැරකම්**

**--------------------**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

**-------------------------------------------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1.16 ප්‍රතිපාදනය රු.මිලියන 5.01 කින් ඉක්මවා රු.මිලියන 3.85 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

**----------------------------------**

අමාත්‍යාංශයට අදාළව 2016 විගණකාධිපති වාර්තාවේ 5.7 ඡේදයේ ඇතුළත්ව තිබුණු පුරප්පාඩු 121 ක් පිරවීමට සමාලෝචිත වර්ෂයේ ද කටයුතු කර නොතිබුණි.

**2.9 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජුනි මස අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ජාතික පුෂ්පය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අනෙකුත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට ප්‍රමාණවත් පරිදි ප්‍රචාරණයක් ලබාදීමට ගන්නා ලද තීරණයට වසර දෙකක් ගත වී තිබුණද එපරිදි කටයුතු කිරීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂය තුළදී කුඩා වැව් 14 ක ප්‍රතිසංස්කරණය කිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළැඹි තිබුණ අතර මාස 03 ක් ඇතුළත ප්‍රතිසංස්කරණ කටයුතු නිමකළ යුතු විය. එහෙත් එම කාල සීමාව තුළ ව්‍යාපෘතිය මගින් කිසිදු වැවක් ප්‍රතිසංස්කරණය කිරීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) රසදිය පිළිබඳ වූ මිනමාටා සම්මුතිය අපරානුමැතිය කිරීම සඳහා පසුබිම ගොඩනැංවීමේ ව්‍යාපෘතිය මගින් 2017 ක්‍රියාකාරී සැලැස්මට පාසල් තාක්ෂණික විද්‍යාල හා විශ්වවිද්‍යාල සඳහා විද්‍යාගාර මාර්ගෝපදේශ මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණ ද එම ක්‍රියාකාරකම ඉටුකර නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලැසුම් හා නියාමන අංශයේ නිලධාරීන් 12 දෙනෙකු සේවයේ නිරත වුවද වාර්ෂික සැලැස්මට අනුකූලව එක් එක් අංශ මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවල නිවැරදිතාවය පිළිබඳ නිසි ඇගයීමකින් තොරව එලෙසම ඉදිරිපත් කිරීම මගින් අපේක්ෂිත අරමුණු නිසි පරිදි ඉටු නොවන බවත්, මේ පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශව වලට තොරතුරු ලබා ගැනීමේදී සාවද්‍ය තොරතුරු ලැබීම නිසා කාර්යසාධනය පිළිබඳ නිවැරදි නියාමනයකට එළැඹිය නොහැකි වන බවත් නිරීක්ෂණය විය.

(ඉ) මහනුවර නගරයේ අහිතකර වායුන්ගේ සංයුතිය සම්මත සාන්ද්‍රණයන්ට වඩා ඉහළ අගයක් ගන්නා බවට පර්යේෂණ වාර්තා ඉදිරිපත් වීම හේතුවෙන් වායුසම්පත් කළමනාකරණ හා ඕසෝන් ඒකකයට අදාල සියළු පාර්ශවයන් සහභාගීත්වයෙන් වායු සම්පත් කළමනාකරණ වැඩ සටහනක් ආරම්භ කර තිබුණු අතර 2017 වර්ෂය තුළ එක් සාකච්ඡාවක් පමණක් පවත්වා තිබුණි. මේ සඳහා මහජන හා විද්වත් අදහස් ලබා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා රු.110,658 ක පිරිවැයක් දරා

තිබුණද වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වීමෙන් එම වියදම නිශ්ඵල වියදමක් වී තිබුණි.

(ඊ) පරිසර මාවත ව්‍යාපෘතියට අනුව තෝරාගත් පළාත් සඳහා පරිසර මාවත් ඇති කිරීමට අමාත්‍යාංශය මගින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත සමාලෝචිත වර්ෂය තුළදී නිදහස් කරන ලද රු.මිලියන 05 ක ප්‍රතිපාදනයෙන් රු. 20,000 ක් පමණක් වැයකර තිබුණු අතර වර්ෂය අවසන් වීමට ආසන්නයේ මෙම ප්‍රතිපාදිත මුදල නිදහස් කිරීම නිසා අපේක්ෂිත ක්‍රියාකාරකම ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමුළුවක් පැවැත්වීම සඳහා ද රු.5,555,270 ක් ව්‍යාපෘතියේ අරමුදලින් ගෙවා තිබුණි.

(ඌ) පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ වටිනාකම රු.1,828,358 ක් වූ එම්එස් ඔෆිස් (MS Office) මෘදුකාංග 52 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ස්ථාවර වත්කම් ලෙස නොව වියදම් ලෙස දක්වා තිබුණි.

(එ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ පහත කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(i) මහවැලි මහ සැලැස්මෙන් ඉවත් වී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සහ පාරිසරික අධ්‍යයනයක් සිදුකර නොතිබීම හා කොන්ත්‍රාත්කරුට එකඟ වූ පහසුකම් මෙන්ම මෙම ගැටළුවලට විසඳුම් කාලීනව ලබාදී නොතිබීම, මෙම ව්‍යාපෘතියේ වර්තමාන ගැටළුකාරී තත්ත්වයට හේතු වී තිබුණි.

(ii) යෝජනාවක් හා ඉල්ලීමක් නොමැති (Unsolicited) පදනමින් කොන්ත්‍රාත්කරු තෝරාගැනීම විනිවිධ භාවයකින් තොරව සිදුකර තිබුණි.

(iii) සංවර්ධන කටයුතු සඳහා රජයට අත්කරගත් ඉඩම්වලට වන්දි මුදල් ගෙවීමේදී ඉඩමේ සිදුකර ඇති සංවර්ධන වටිනාකම් වෙනුවෙන් ගෙවන අමතර දීමනා, ප්‍රතිස්ථාපන දීමනා වෙනුවෙන් පොලී මුදල් ගෙවිය නොහැකි වුවත් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමා ඔය ව්‍යාපෘතිය සඳහා පවරාගත් ඉඩම් වෙනුවෙන් රු.4,620,420 ක පොලියක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) උමා ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී කැබලි අංක 602,603,609 දරන ඉඩම් සඳහා රු.850,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ **අමාත්‍යාංශයට** සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 633 | 599 | 34 | 5.37 |
| | මූලධන | 1,478 | 761 | 717 | 48.51 |
| | එකතුව | 2,111 | 1,360 | 751 | 35.57 |
| 2014 | පුනරාවර්තන | 787 | 771 | 16 | 2.03 |
| | මූලධන | 1,862 | 1,093 | 769 | 41.30 |
| | එකතුව | 2,649 | 1,864 | 785 | 29.63 |
| 2015 | පුනරාවර්තන | 816 | 801 | 15 | 1.84 |
| | මූලධන | 35,071 | 27,920 | 7,151 | 20.39 |
| | එකතුව | 35,887 | 28,721 | 7,166 | 19.97 |
| 2016 | පුනරාවර්තන | 3,776 | 3,758 | 18 | 0.47 |
| | මූලධන | 61,771 | 38,557 | 23,214 | 37.58 |
| | එකතුව | 65,547 | 42,315 | 23,232 | 35.44 |
| 2017 | පුනරාවර්තන | 3,717 | 3,668 | 49 | 1.32 |
| | මූලධන | 50,796 | 39,154 | 11,642 | 22.92 |
| | එකතුව | 54,513 | 42,822 | 11,691 | 21.45 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කාර්යයන් ඉටු කිරීමට යෝජිත කාල රාමුව ගැන නොසලකා ප්‍රතිපාදන සලසා ගැනීම**

අමාත්‍යාංශය විසින් කාර්ය ඉටු කිරිම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය මුළු ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශක්‍යතා අධ්‍යයනයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාර්යයන් ඉටු කිරීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු. 3,387,741,258 ක් හෙවත් සියයට 30 සිට 99 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රතිපාදන අවශ්‍යතාව නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව වැය විෂයයන් අතර, ප්‍රතිපාදන මාරුකර තිබීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 06 ක් වෙත මාරුකර තිබුණු රු.මිලියන 2,503 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 1,060 ක් හෙවත් සියයට 28 සිට 100 අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ii) පරිපූරක ප්‍රතිපාදනවලින් සියයට 100 ක් ඉතිරිවීම්වල කසල කළමනාකරණය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයට භූගත කසල පිරවුමක් ඉදිකිරීම සඳහා ලැබී තිබුණු රු.මිලියන 10 ක්

වූ පරිපූරක ප්‍රතිපාදනය භාණ්ඩාගාරය විසින් අවුරා ඇති බව ඉතිරි කිරීම් සඳහා හේතු ලෙස සඳහන් කර තිබුණද පිළිගත හැකි ලිඛිත සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී මූලධන වියදම් සඳහා ලබාගන්නා ලද පරිපූරක ප්‍රතිපාදනවලින් වැය විෂයන් දෙකක් වෙත ලබාගන්නා ලද රු.මිලියන 10.33 ක් වූ මුළු ප්‍රතිපාදනයම ද තවත් වැය විෂයයන් 02 ක් සඳහා ලබාගන්නා ලද පරිපූරක ප්‍රතිපාදන රු.මිලියන 102.3 කින් සියයට 66 සිට 94 ක් දක්වා ප්‍රමාණයක් ද ඉතිරිවී තිබුණි.

## 2.11 අග්‍රිම ගිණුම්

------------

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 01 ක 2017 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු.මිලියන 0.26 ක් විය. අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල 2017 දෙසැම්බර් 31 දිනට නොපෙනෙන මුදල් ශේෂය හා නොපිය වූ උප අග්‍රිම එකතුව පිළිවෙලින් රු.මිලියන 53.60 ක් හා රු. 261,361 ක් විය.

(ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 114 කට අවස්ථා 478 කදී එකතුව රු.මිලියන 8.38 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඇ) ඉහත සඳහන් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 24 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.742,289 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 01 ක සිට මාස 11 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් එම අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම්

------------------------

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 56.88 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමෙන් පසුව ආපසු ලබා ගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් හැකිතාක් දුරට වළකා ගැනීමේ අදහසින් එම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට පෙර විමසිය යුතුය. අමාත්‍යාංශය විසින් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර තිබුණද එසේ පෙර විමසීමක් සිදුකළ බවට තොරතුරු විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ගෙවීමට තිබෙන රු.69,431 ක චෙක්පත් 06 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.13** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---

බැංකු ගිණුමකට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව රු.3,396,150 ක හඳුනා නොගත් ලැබීම් 2018 අප්‍රේල් 17 දිනය වන විටද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.14** **අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි 104 | | අවස්ථා 04 කදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් අදාළ රක්ෂණ ආයතනයෙන් හානි පූර්ණය කරගෙන තිබුණි. නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව එම හානි සම්බන්ධයෙන් පූර්ණ වාර්තා පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 215 (1) හා (3) | 2,301,125 | 2017 දෙසැම්බර් 30 දින වන විටත් අමාත්‍යාංශයට ලැබී නොතිබුණු වර්ග 04 ක පොත් සඳහා රු.2,301,125 ක මුදලක් (පෞද්ගලික මුද්‍රණාල දෙකකට) චෙක්පත් 04 ක් මගින් ගෙවීමට කටයුතු කර තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 751 | - | i. අමාත්‍යාංශයේ සියළුම ලැබීම් ගබඩාව මාර්ගයෙන් සිදු වී නොතිබු අතර විවිධ අංශ මගින් මිල ගණන් කැඳවා මුද්‍රණය කරවා ගන්නා ලද පොත්, පත්‍රිකා සහ වෙනත් උපකරණ, මිලට ගැනීම් හා නිකුත් කිරීම් ගබඩා තොග පොතට ඇතුළත් කර නොතිබුණි. |

ii. පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ බඩු ලේඛන පොත යාවත්කාලීන කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි 753 (1) | - | භාණ්ඩ නිකුත් කරන කල්හී පොදු 141 ආකෘති පත්‍රය පිළියෙල කර මුල් පිටපත භාණ්ඩ යවන නිලධාරියාටද දෙවනි පිටපත ගබඩාව භාරයේ ද තබාගත යුතු වුවද නිකුත් කිරීම් සඳහා පොදු 141 භාවිතා කර නොතිබුණි. එසේම පැරණි අමාත්‍යාංශ කාර්යාලයේ තිබූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විවිධ රාජ්‍ය ආයතන වෙත නිකුත් කළ බවට සටහන් තබා තිබුණත් එම නිකුත් කිරීම් සඳහා පොදු 141 ආකෘති පත්‍රය නිකුත් කර නොතිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 753 (2) | - | භාණ්ඩ ලැබුණු කල්හී එම භාණ්ඩ භාරගන්නා නිලධාරියා විසින් පොදු ආකෘති 219 පිටපත් දෙකකින් යුක්තව පිළියෙල කර මුල් පිටපත් (ගෙවීම් වවුචරයටත්) නිකුත් කළ නිලධාරියාට යවා දෙවන පිටපත තබාගත යුතු වුවත් මුදල් අංශයෙන් බැහැරව මිලදී ගැනීම් කළ අවස්ථාවන් වලදී ආකෘති 219 ලියා නොතිබුණි. |
| (ඊ) | මුදල් රෙගුලාසි 754 | - | සියළු භාණ්ඩ ලැබීම් නිකුත් කිරීම් නිසි පරිදි ගණන් තැබිය යුතු වුවද භාණ්ඩ ලැබීම් නිකුත් කිරීම් නිසි පරිදි ඇතුළත් කර බඩු ලේඛන පොත් තුලනය කර යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවත් එසේ සිදු නොකළ අවස්ථා 05 ක් නිරීක්ෂණය විය. |
| (උ) | මුදල් රෙගුලාසි 757 | - | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය | - | පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. |
| (එ) | 2015 ජුලි 10 දිනැති 02/2015 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | අපහරණය සඳහා කටයුතු කළ යුතු බව සඳහන්ව තිබුණද අමාත්‍යාංශයේ ධාවනයෙන් ඉවත් කළ වාහන 04 ක් වසර 02 සිට 11 ක කාලසීමාවක් තුළ අළුත්වැඩියා කර පාවිච්චි කිරීමට හෝ අපහරණය සඳහා කටයුතු කිරීමට පියවර නොගෙන දිරාපත්වීමට ඉඩහැර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය හා 2015 සැප්තැම්බර් 25 දිනැති අංක එස්බී/07/15 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | 384,681 | උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සඳහා පෞද්ගලික හෝටල් තෝරා නොගත යුතු බව දන්වා ඇතත් ඉන් බැහැරව ශ්‍රී ලංකාව තුළ පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා ඒවා අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය විසින් පෞද්ගලික හෝටල් සඳහා ගෙවා තිබුණි. |
| (ඔ) | 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | - | එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක් හෝ ඊට වැඩි ව්‍යාපෘති සඳහා පූර්ව ව්‍යාපෘති ඇගයීම් අදියරයේදී අභ්‍යන්තර විගණකවරයෙකු ව්‍යාපෘති කාර්යමණ්ඩලයට ඇතුළත් කළ යුතු වුවත්, 2018 ජුලි 13 දින වන විටත් පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි. |

**2.15 අභ්‍යන්තර විගණනය**

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර තිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ඒ සඳහා අනුයුක්ත කර නොතිබුණි.

**2.16 මානව සම්පත් කළමනාකරණය**

**2.16.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 199.95 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.649,182 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 92 | 54 | 38 |
| (ii) | තෘතියික මට්ටම | 36 | 15 | 21 |
| (iii) | ද්විතියික මට්ටම | 200 | 150 | 50 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 102 | 87 | 15 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 02 | 02 | - |
| | | **432** | **308** | **124** |

**2.17 රජයේ නිලධාරීන් ඇප තැබීම**

**--------------------------------**

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවැරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතුය. එසේ වුවද අමාත්‍යාංශයේ ඇප තැන්පත් තැබිය යුතු නිලධාරීන් සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි.